දකුණු පළාත් සභාව - 2018
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

දකුණු පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින නිකුත්කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 14 දින නිකුත් කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය

ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යායුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදි.

1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**1.6** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1.6.1** ගණකාධිකරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දුගී දුප්පත්කම දුරලීමේ වක්‍රීය අරමුදලේ රු.39,900,334ක් වූ ශුද්ධ වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ආයෝජන යටතේ දක්වා තිබියදී, උක්ත අරමුදලේ රු.2,610,720ක් වූ ස්ථාවර තැන්පතු මුදල නැවත ආයෝජන යටතේ දැක්වීම හේතුවෙන් වත්කම් රු.2,610,720කින් වැඩියෙන් දක්වා තිබුණි. | ද්විගණනයන් සිදුනොවීමට කටයුතු කළ යුතුය. | විගණනයේ නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතුකරන බව සඳහන් කරමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයට වැය විෂයය අංක 1405 යටතේ ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී, එකී වැය විෂයය යටතේ වාර්ෂික වියදම රු.32,131,855 ක සෘණ අගයක් හා ඉදිරියට ගෙවීම් රු.118,781ක් දක්වා තිබුණි. | නිවැරදිව වැය විෂයයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. | විගණනයේ නිරීක්ෂණය පිළිගනිමි. වැයවිෂය අංක 1405, 2017 වර්ෂයේ ස්ථාපිත වැයවිෂයකි. 2018 වර්ෂයේ එම වැයවිෂය නොමැත. 2017 වර්ෂයේ අවසානයේ උපචිත වියදම් හා ඉදිරියට ගෙවීම් පැවැති බැවින් 2018 වර්ෂයේ වාර්ෂික වියදම සෘන අගයක් ගෙන ඇත. 1405 වැයවිෂය වෙනුවට මෙම වර්ෂයේ හඳුන්වා දී ඇති 1409 වැයවිෂයට එම වියදම් ගැලපීම්කිරීමට කටයුතුකරන ලෙසට උපදෙස්දෙන ලදී. |
| (ඇ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරියට කළ ගෙවීම් ලෙස රු.10,104,545ක් වැඩියෙන් ගිණුම්ගතකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි. | පළාත් භාණ්ඩාගාරය විසින් නිවැරදි ප්‍රාථමික දත්ත අදාල ආයතන වලින් ලබාගෙන වියදම් ගිණුම්ගත කළයුතුය. | ශීර්ෂ අංක 305 - පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව ඉදිරියට ගෙවීම් ගැලපීම සිදුකර ඇත. එම මුදල සකස්වීමට අදාළ ප්‍රාථමික දත්ත පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු බව සඳහන් කරමි. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරියට කළ ගෙවීම් ලෙස රු.80,811,033ක් වැඩියෙන් ගිණුම්ගතකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම මෙම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | පළාත් අරමුදල් ගිණුම සකස්කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙවීම් හා උපචිත ගෙවීම් පිළිබඳ තොරතුරු අනුව ශීර්ෂ අංක 305 - පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් |

| | | |
|---|---|---|
| | | තොරතුරු අනුව ඉදිරිපත්කර ඇති අවසාන, ඉදිරියට ගෙවීම් පළාත් අරමුදල් ගිණුමට උපයෝගීකරගෙන ඇත. නමුත් වැරදීමකින් උපචිත ගෙවීම ඉදිරියට ගෙවීම් ලෙස සඳහන්කිරීමක් සිදුව ඇති අතර, මේ පිළිබඳ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් නැවත විමසා නිවැරදිකිරීමට කටයුතුකරන බව දන්වමි. |
| (ඉ) ආදායම් සංකේත අංක 1003 -01-01 මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තුවලට අදාළව ඉකුත් වර්ෂය දක්වා හිඟ ආදායම් ගිණුම්ගතකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට අදාළ හිඟ ආදායම් වාර්තා අනුව හිඟ ආදායම රු.1,538,171,385ක් විය. අදාළ හිඟ ආදායමෙන් රු.722,969,379ක් දකුණු පළාත් මූල්‍ය රීති 62 විධිවිධාන කිසිවක් අනුගමනය නොකර විධිමත් පදනමක් රහිතව අඩුකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.815,202,006ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | හිඟ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළයුතුය. | පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති 2018.12.31 දිනට හිඟ ආදායම් වාර්තා අනුව මෙම වටිනාකම පළාත් අරමුදලට ගෙන ඇත. මෙම හිඟ ආදායම සකස්වී ඇති ආකාරය හෝ ඒ පිළිබඳව කිසිඳු විශ්ලේෂණයක් අප වෙත ඉදිරිපත්කර නොමැති අතර හිඟ ආදායම් කපාහැරීමට හෝ වෙන්කිරීමට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු අප සතු නොවන බැවින් වෙන්කිරීමක් හෝ කපාහැරීමක් සිදු කර නැත. |
| (ඊ) අරමුදල් ගිණුමේ අවසන් තොගය ලෙස ශීර්ෂ 25ට අදාළව එකතුව රු.50,311,874ක් වූ ලිපිද්‍රව්‍ය හා වෙනත් තොග ඇතුළත් වුවද, එක් එක් ශීර්ෂවලට අදාළව ඉදිරිපත්කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල එම තොගයන් ඇතුළත්කර නොතිබුණි. | අන්තර් ගිණුම් අතර ගනුදෙනු නිවැරදිව ගිණුම්ගතකිරීම කළ යුතුය. | පළාත් අරමුදල් ගිණුම සකස්කිරීමේදී අප විසින් ශීර්ෂ 25න්ම ලිඛිතව ගෙන්වාගෙන ඇති තොරතුරු මත පදනම්ව අවසන් ලිපිද්‍රව්‍ය හා වෙනත් තොග වටිනාකම හඳුනාගෙන ඇත. |
| (උ) සමාලෝචිත වර්ෂය අවසානයට වාණිජ අත්තිකාරම් ගිණුම් 4 ක රු.114,053,444ක් වූ එකතු හර ශේෂය වාණිජ අත්තිකාරම් ගිණුම් 6ක රු.52,594,135ක එකතු බැර ශේෂය සමඟ හිලව්කර රු.61,459,309ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව කටයුතු කළයුතුය. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරි වර්ෂයේ සිට හර ශේෂ ඇති අත්තිකාරම් ගිණුම් ජංගම වත්කම් යටතේද බැර ශේෂ ඇති අත්තිකාරම් ගිණුම් ජංගම වගකීම් යටතේ ද ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.6.2 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන රු.1,486,024,261ක් වූ හිඟ ආදායම් අයකරගැනීමේ අවිනිශ්චිත බවක් පැවතියද, ඊට අදාළව බොල්ණය කපාහැරීමක් හෝ අඩමාන ණය වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කළයුතුය. | නිරීක්ෂණය පිළිගනිමි. සටහන අංක 12 හි ඉදිරිපත්කරන රු.1,486,024,261ක් වූ හිඟ ආදායම් අයකරගැනීම දැඩි අවිනිශ්චිතබවක් පවතින බවට කිසිදු ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු විසින් ලිඛිතව දැනුම්දීමක් සිදුකර නොමැත. එබැවින් ඊට අදාළව බොල්ණය වෙන්කිරීමක් හෝ කපාහැරීමක් සිදුකර නොමැත. කෙසේ වුවද විගණනයෙන් පෙන්වාදෙනලද කරුණු කෙරෙහි අවධානය යොමුකර පසුගිය වර්ෂවල සත්‍ය හිඟ ආදායම් ලැබීම් පදනම්කරගෙන ලැබිය යුතු ආදායම හඳුනාගැනීමට කටයුතු කරමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.319,062,138ක් වූ නොපියවූ අග්‍රිම ශේෂයෙන් රු.306,482,670ක් 2019 මාර්තු 31 දින වන විටත් පියවා නොතිබුණි. | අග්‍රිම ශේෂයන් පියවීමට කටයුතු කළයුතුය | නිරීක්ෂණය පිළිගනිමි. තවදුරටත් පියවීම් සිදුකර නොමැති ආයතන වෙත එම අග්‍රිම ශේෂ පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙමි. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දුගී දුප්පත්කම දුරලීමේ චක්‍රීය අරමුදලේ අයවීමට පැවති රු.37,186,633ක් වූ ණයගැති ශේෂය, වර්ෂ 25කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර මෙම ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මුදලක් අයවී නොතිබුණි | ණයගැති ශේෂ නිරවුල්කර ගැනීමට කටයුතු කළයුතුය | නිරීක්ෂණය පිළිගනිමි. අය නොවී පවතින චක්‍රිය අරමුදලේ ණයශේෂ කපාහැරීමට කටයුතු කරමි. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ පැවති රු.60,226,914ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 10කට වඩා වැඩි කාලයක් අයනොවී පවතින රු.9,519,974ක් හා වර්ෂ 03කට වඩා වැඩි කාලයක් අයනොවී පවතින රු.2,760,717ක ණය ශේෂ පැවතුණි. | දිගු කාලයක් තිස්සේ පවතින ණය ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළයුතුය | දේශිය බීජ ණය හා තේ පැළ ණයගැතියෝ යන කරුණු සම්බන්ධයෙන් මේ වන විට අදාළ පාර්ශවයන්ට එරෙහිව නීතිමය කටයුතු ක්‍රියාත්මකවෙමින් පවතී. විවිධ ව්‍යාපෘතිවල එන මෙම ණයගැති ශේෂ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග කෙරෙහි යොමුවීමට |

| | | |
|---|---|---|
| | | තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා විශේෂ කමිටුවක් පත්කර ඇත. |
| (ඉ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් දියුන ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ශේෂ 20කට අදාළව හිඟහිටි ණය වාරික හා පොලිය රු.1,092,984ක් විය. | මෙම ණය වාරික හා පොලී අයකරගැනීමට කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. | 2018.12.31 දිනට පැවති ණය ශේෂය වන රු.1,092,984ක මුදලින් මේ වන විට රු.454,050ක මුදලක් අයකරඇති අතර ඉතිරි හිඟ ණය වාරික අයකරගැනීමේ ක්‍රියාමාර්ගවලට යොමුවී ඇත. ක්‍රමවත්ව ණය වාරික නොගෙවූ හිඟ ණයකරුවන් සඳහා දැනටමත් නීතිමය කටයුතුකිරීමට පියවර ගෙන ඇත. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් එකතුව රු.12,280,690 ක් වූ ණයගැතියන් සහ වටිනාකම රු.283,555 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන ඉදිරිපත් නොකෙරුණි. | ණයගැතියන් හා ණය හිමියන් සම්බන්ධයෙන් විස්තරාත්මක උප ලේඛන සහ ශේෂ සනාථන ඉදිරිපත්කළ යුතුය. | මෙම ණයගැති ශේෂ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග කෙරෙහි යොමු වීමට තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇත . |

1.6.4 අනුකූල නොවීම්

නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත | (i) ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තු | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු | දේශීය ආදායම් බදු පනතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මතුව තිබූ ගැටළු නිසා මෙම තත්ත්වය මතුව ඇති අතර හිඟ මුදල් වාරික වශයෙන් |

| | | | |
|---|---|---|---|
| | වේ නිලධාරීන් 10 දෙනෙකුගේ, මාසික සේවා නියුක්ත ආදායම පදනම් කරගෙන උපයනවිට බදු රු .137,478 ක් අඩුවෙන් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණයකර තිබුණි. | පනත අනුව කටයුතු කළයුතුය. | අය කරමින් පවතී |
| | (ii) නිල වාහන භාවිතා කරන නිලධාරීන්ගේ සේවා නියුක්ත ආදායම ගණනය කිරීමේදී ඉන්ධන දීමනාව සලකා නොතිබුණි | | |
| (ආ) පළාත් සභා මූල්‍ය රීති අංක 283.4 | ආයතන 04 ක බැංකු ජංගම ගිණුම් 14 කට අදාළව නිකුත් කර තිබුණු නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලය ඉක්මවූ රු.4,788,520 ක චෙක්පත් 113 ක් සම්බන්ධයෙන් පළාත් සභා මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පළාත් සභා මූල්‍ය රීති අංක 283.4 අනුව කටයුතු කළයුතුය | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ පොදු තැන්පත් ශේෂයන් රාජ්‍ය ආදායමට ගැනීමට | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කළ යුතු වුවද, ආයතන 06 කට අදාළ රු.22,644,417ක පොදු තැන්පත් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අනුව කටයුතු කළයුතුය. | |
| (ඈ) 2017 නොවැම්බර් 28 දිනැති අංක 29/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(i) ඡේදය | හබරාදුව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය යටතේ සේවය කරන පාසල් මුරකරුවෙකු සතියේ සේවයේ යෙදිය යුතු දින ගණනට වඩා අඩුවෙන් සේවයේ නිරතවීම නිසා ඔහු සේවය කළ අවුරුදු 22 මාස 09 ක සේවා කාලය සඳහා රු. 645,836 ක් වැඩිපුර වැටුප් ගෙවා තිබුණි. | 2017 නොවැම්බර් 28 දිනැති අංක 29/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම අවභාවිතා වී ඇති මුදල 2019 වර්ෂයේ ජනවාරි මස මුල සිට ඔහුගේ වැටුපෙන් අයකිරීමට කටයුතු කරමි. |
| (ඉ) 2015 මාර්තු 10 දිනැති අංක 03/2014(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වේ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්කර තිබුණු නිලධාරියෙකු රාජකාරී ඉටුකිරීමේ පදනම මත එකී ශ්‍රේණියේ පළමුවන ශ්‍රේණියේ තනතුරකට (ඇල්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මෙම රාජකාරි ඉටු කිරීමේ දීමනාව ගෙවීමට දකුණු පළාත් අධ්‍යාපන ලේකම් අනුමත කර ඇති බැවින් එම නිලධාරියාට එම මුදල ගෙවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලෙස) පත්කිරිම හේතුවෙන් 2014 සැප්තැම්බර් සිට 2018 සැප්තැම්බර් දක්වා රු. 445,726 ක රාජකාරී ඉටු කිරීමේ දීමනාවක් සහ දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. | | |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදයේ සිට 8 පරිච්ඡේදය දක්වා | ගාල්ල කලාපයේ පාසැල් 2 ක් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කටයුතු කර රු.4,072,212 ක මිළදී ගැනීම් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. | අදාළ සියළු මිලදී ගැනීම් විධිමත් ක්‍රමවේදයකට සිදුකර ඇති බව ප්‍රකාශ කරමි. |

1.6.5 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචිය අවලංගු වූ කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු.1,343,393 ක් වූ වැට් බදු මුදලක් වහාම ආපසු අයකර රාජ්‍ය ආදායමට බැර කර වාර්තා කරන ලෙස 2017 ඔක්තෝබර් 07 දින පැවති පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාව විසින් නියෝග කර තිබුණු නමුත්, 2019 අප්‍රේල් 30 දින වන විටත් අදාළ මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කාරක සභාවේ නියෝග අනුව කටයුතු කළයුතුය | දැනට නොගෙවීමක් වශයෙන් ඉතිරි වී ඇති රු.706,231 සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නොමැති බැවින් නීතිමය උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ක්‍රියා කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.585,671,505 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ නැවත ගලපන ලද අතිරික්තය රු.422,079,412 ක් විය. සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ලෙස රු.658,135,478 ක් ගිණුම්ගත කිරීම හා ඉදිරියට කළ ගෙවීම් රු.80,811,033ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම මෙහෙයුම් ප්‍රතිඵලය අතිරික්තයක් වීමට බලපා තිබුණි.

3. ආදායම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක පළාත් සභාව විසින් උපයාගෙන තිබුණු බදු සහ බදු නොවන ආදායම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ. | බදු නොවන ආදායම් වර්ධනය කරගත යුතුය. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන බදු ආදායම් ඉකුත් වර්ෂවලට සාපේක්ෂව ඉහල යාමට රැස් කරනු ලබන බදු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් වීම ප්‍රධාන හේතුවකි. |

| ආදායම් වර්ගය | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
| --- | --- | --- | --- | --- | --- |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන |
| බදු ආදායම | 8,184 | 7,724 | 6,440 | 5,654 | 4,864 |
| බදු නොවන ආදායම | 988 | 1,068 | 789 | 650 | 546 |
| එකතුව | 9,172 | 8,792 | 7,229 | 6,304 | 5,410 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු. මිලියන 460 කින් එනම් සියයට 6 කින් වර්ධනයවී තිබුණු අතර, බදු නොවන ආදායම රු.මිලියන 80 කින් එනම් සියයට 7 කින් අඩුවී තිබුණි.

(ආ) හිඟ ආදායම්

-------------

| | | | |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට දේපල පැවරීම් මත හිඟ මුද්දර බද්ද රු.මිලියන 595.07 ක් ලෙස දකුණු පළාත් සභා අරමුදල් ගිණුමට ගිණුම්ගතකර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී මීට අදාළ හිඟ ආදායමෙන් සියයට 12.01 ක් අයකිරීමේදී සියයට 25.12 ක් නිදහස්කර තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුය. | සමස්ථයක් ලෙස සැලකූ විට 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය වර්ධනය වීමක් දක්නට ඇත. එසේ වුවද ඖෂධ හා රසායන බද්ද සම්බන්ධයෙන් රැස්කිරීමේ ප්‍රතිශතය අඩුවීමක් දක්නට ඇති බව පළාත් ආදායම් කොමසාරිස් දන්වා එවා ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී හිඟ බදු ආදයම් අයකිරීමේ ප්‍රතිශතය සියයට 3 සිට සියයට 24 දක්වා ඉතා අඩු මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුය. | |
| (iii) | පෙර වර්ෂවලට සාපේක්ෂව ඖෂධ වෙළෙඳුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු හා ඛනිජ අයිතීන් මත බදුවලට අදාළව සමාලෝචිත වර්ෂයේ හිගආදායම පිළිවෙලින් සියයට 53 කින් හා සියයට 26 කින් ඉහළගොස් තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුය. | |

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

--------------------

4.1.1 රජයේ ප්‍රදාන

--------------

සමාලෝචිත වර්ෂයට අදාළව පළාතේ සංවර්ධන කාර්යයන් සඳහා ලැබී තිබුණු රජයේ ප්‍රදාන හා ඒවා උපයෝජනය පහත පරිදි වේ.

| මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|
| | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 2,130.22 | 1,544.52 | 585.70 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 983.71 | 822.37 | 161.34 |
| අධ්‍යාපනික ආංශික සංවර්ධන සැලැස්ම (TSEP) | 214.28 | 212.92 | 1.36 |
| දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන සැලැස්ම(HSDP) | 558.80 | 299.40 | 259.40 |

4.1.2 සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම වූ රු. මිලියන 3,117.78 ක යෝජනා 2064 ක් සඳහා අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද වැඩ යෝජනා ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | (රු.මිලියන) |
| සම්පූර්ණයෙන් නිමකළ | 1544 | 302 | 1846 | 2,244.37 |
| 50 % කට වඩා ඕයෙන් නිමකළ | 86 | 9 | 95 | 562.73 |
| 50 % කට වඩා අඩුවෙන් නිමකළ | 70 | 3 | 73 | 173.11 |
| ආරම්භ කර නොතිබූ | 50 | 0 | 50 | 137.57 |

අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම (TSEP), දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන සැලැස්ම (HSDP) හා ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියට අදාළව පළාත තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති පළාත් සැලසුම් ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කර නොතිබුණු අතර එකී වැඩසටහන් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉහත සටහනට ඇතුළත්ව නොතිබුණි.

දකුණු පළාත තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කළ යුතුය.

නියමිත කාල සීමාව තුළ ඇස්තමේන්තු සකසා ගැනීමට නොහැකි වීම සහ නියමිත කාලයේදී ප්‍රතිපාදන නොලැබීම වැනි කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වූ බව අදාල අමාත්‍යාංශ විසින් දන්වා ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම් හා මෙහෙයුම්) විසින් දන්වා ඇත.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දකුණු පළාත් පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු රු.155,000,000 ක මූල්‍ය ප්‍රතිපාදනයෙන් 2019 ජනවාරි 18 දින වනවිටත් රු.15,898,361 ක් ලැබී නොතිබුණු අතර, ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 30 දිනට අවසන් කළයුතු වුවද, එදිනට වැඩ නිම නොකල ව්‍යාපෘති 24 ක් විය. | මුදල් ලබා දී නිම නොකළ ව්‍යාපෘතින් කඩිනමින් නිමකර සිසුන්ගේ භාවිතයට ලබාදිය යුතුය. | වැඩ නිම කිරීමට ඇති පාසැල් 23 න් 14කට තවදුරටත් මුදල් ලැබීමට නියමිත අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඒ සඳහා ඉල්ලීමක් කර ඇත.<br>එම මුදල ලද විගස පාසැල් වෙත මුදල් ලබාදීමට කටයුතු කරනු ලැබේ. තවදුරටත් මුදල් ලැබීමට නියමිත වැඩ අවසන් නොකළ පාසැල් 14 ක් හා මුළු මුදල ලැබී වැඩ නිම කිරීමේ ප්‍රගතිය සියයට 60 ත් සියයට 90 ත් අතර ඇති පාසල් 09 ක් ඇත. |
| (ආ) ගා/රතනසිරි රාජකීය විදුහලේ පළමු ශ්‍රේණිය පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන ගේට්ටුව අසල පිහිටි ගොඩනැගිල්ල අසලට පස් කණ්ඩිය සමඟ විශාල ගලක් පෙරලී තිබූ අතර, පස් කණ්ඩියට ඉහළින් තිබූ අබලන්ව අතහැර දමා තිබුණු ගොඩනැගිල්ලද ඉතා අවධානම්කාරී බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කර තිබියදී පළමු ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතු එකී ගොඩනැගිල්ල තුළම සිදුකරමින් තිබුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම මුදල් ලබා දුන් වහාම පාසල් වෙත ලබා දීමට කටයුතු කරන බව දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දන්වා ඇත. |
| (ඇ) දකුණු පළාත් සභාවේ 1995 අංක 1 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තියේ II වන කොටසේ අංක 7(1), (2) හා (3) වගන්ති ප්‍රකාරව, කටයුතු නොකිරීම හේතුවෙන් වසර ගණනාවක සිට සාමාජිකයින් 6 දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස පත්කර නොතිබුණි. ඒ අනුව මුළු සාමාජික සංඛ්‍යාව වූ 15 කින් 6 දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය නොවූ අතර සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ | අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළයුතුය | අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම සියළු නිලධාරීන් පත් කිරීම සඳහා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රයත්න දැරුව ද එකී සියළු නිලධාරීන්ගේ සහභාගී වීම දුර්වල මට්ටමක පැවතුනි. |

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 14 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පස්දෙනෙකු පමණක් සහභාගී වී තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දකුණු පළාත් සභාවේ 2009 අංක 1 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී (සංශෝධිත) ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ 2012 සැප්තැම්බර් 26 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1777/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2012 අංක 01 දරන ත්‍රීරෝද රථ මගී ප්‍රවාහන සේවා රෙගුලාසි හා 2012 අංක 2 දරන පාසැල් සිසුන් ප්‍රවාහන සේවා රෙගුලාසි සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2012 අංක 01 දරන ත්‍රීරෝද රථ මගී ප්‍රවාහන සේවා රෙගුලාසි හා 2012 අංක 2 දරන පාසැල් සිසුන් ප්‍රවාහන සේවා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය | ඊට අදාල ජාතික ප්‍රතිපත්ති සැකසීමකින් තොරව මෙම තත්ත්වය නිවැරදි කල නොහැක. |
| (ආ) කාර්මික කැණීම් බලපත්‍ර 3 ක් යටතේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිදුකරන ලද කැණීම් කටයුතු වලදී කැණීම් බලපත්‍රයේ සඳහන් භූගෝලීය ස්ථානීය පිහිටීම (GPS) කාණ්ඩ අංක සහ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලබාගත් GPS කාණ්ඩ අංක අතර විශාල පරාසයක වෙනස්වීම් පැවතුණි. ඉන් එක් ගල් වලක් සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අවසර ලබාදී තිබූ වපසරිය අක්කර 1.5 ක සීමාව ඉක්මවා අක්කර 3.2 ක භූමි ප්‍රදේශයක් අනවසරයෙන් කළුගල් කඩා ඉවත්කර තිබුණි. විගණනය විසින් ලබාගත් තහවුරු කිරීම අනුව එසේ අනවසරයෙන් කඩා ඉවත්කර ඇති කළුගල් ප්‍රමාණය කියුබ් 31,772 ක් වූ අතර, එහි වෙළඳපල වටිනාකම රු.47,658,000 ක් විය. එමෙන්ම බලපත්‍ර කොන්දේසි ප්‍රකාරව ඉඩමේ මායිම් වටා මීටර් 5 ක බිම් තීරුවක් කැණීම් වලින් අත්හැරිය යුතු වුවද,එසේ කර නොතිබුණි. ගල් කඩා ඉවත් කර තිබුණු එක් ගල් වලක ගැඹුර බලපත්‍ර කොන්දේසි කඩ | බලපත්‍රයේ විධිවිධාන අභිබවා කටයුතු කිරීම පිළිබඳව නිත්‍යානුකූලව කටයුතු කළයුතුය. | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් වෙත සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලිපියක් යවා ඇත. ඒ සඳහා පිළිතුරු ලද පසුව සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

කරමින් මීටර් 14.5 ක් දක්වා විහිදී පැවතුණු අතර එම භූමියද දළ බෑවුමක ස්වභාවයක් ගෙන ඉතා අවදානම් තත්ත්වයක පැවතුණි. තවද, ගල් කඩා ඉවත්කළ ගල් වලවල් පසුව විධිමත්ව සංරක්ෂණ කටයුතු සිදුනොකිරීම නිසා ජලය පිරී අනාරක්ෂිතව පැවතුණි.

## 4.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වක්වැල්ල කළමනාකරණ පුහුණු ආයතනයේ පුහුණු කටයුතු අධීක්ෂණය කිරීම සහ පුහුණු වැඩසටහන් සමායෝජනය කිරීම පිළිවෙලින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) හා අධ්‍යක්ෂ තනතුරෙහි නිත්‍ය රාජකාරි වේ. එසේ වුවද, එම නිත්‍ය රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් හා පුහුණු) හා අධ්‍යක්ෂ වෙත රු. 567, 000 බැගින් රු.1,134,000 ක අමතර දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. තවද, දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ 2017 මැයි 29 දිනැති අංක G/SP/6/8-4 දරන ලිපියේ කොන්දේසිවලට අනුකූල නොවී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) හා අධ්‍යක්ෂ වෙත සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.424,687 ක හා රු.149,857 ක දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | නිත්‍ය රාජකාරි කටයුතු වෙනුවෙන් ගෙවන ලද අමතර දීමනා නීත්‍යානුකූල නොවන බැවින් ආපසු අයකරගත යුතුය. | පුහුණු කටයුතු අධීක්ෂණය කිරීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරට අයත් නිත්‍ය රාජකාරියක් වුවත් දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය ආදායම් උපයන ආයතනයක් වන අතර අධීක්ෂණ දීමනාව ආණ්ඩුකාර ලේකම්ගේ 2011.07.06 දිනැති ලිපිය හා, ආණ්ඩුකාර ලේකම්ගේ 29/05/2017දිනැති ලිපිය අනුව ගරු ආණ්ඩුකාරවරුන්ගේ අනුමැතිය පරිදි ගෙවනු ලැබේ. තවද එම දීමනා අනෙක් පළාත් සභාවල සහ පුහුණු වැඩසටහන් පවත්වන අනෙක් ආයතනවල 1991 වර්ෂයේ සිට ගෙවනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ) ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුමේ කල්පිත ගාස්තු ගැලපීමට පසු රු.25,677,041 ක් වූ ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි සාවද්‍ය ලෙස රු.14,259,304 ක ශුද්ධ ලාභයක් ලෙස දක්වා එකී ශුද්ධ ලාභයෙන් රු.1,425,861 ක් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් හා සේවකයින් 108 දෙනෙක් වෙත ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. නිලධාරීන් හා සේවකයන් 7 දෙනෙකු ලබාගෙන තිබූ ප්‍රසාද දීමනාව එකවර ආපසු ගෙවා තිබූ අතර, නිලධාරින් හා සේවකයන් 62 කට අදාළ ගෙවීම් වාරික ක්‍රමයට අයකිරිමට තීරණය කර තිබුණි. ඉතිරි සේවකයන් 39 දෙනෙකුගෙන් අයවිය යුතු රු.396,741 ක් අයවී නොතිබුණි. | අයකර නොගත් සියළු මුදල් අයකරගත යුතුය. | විමසීමට භාජනය කරන ලද රු.396,741 ක මුදලින්, මේ වනවිට අයකර ගෙන අවසන් ප්‍රසාද දීමනා මුදල රු. 220,246 ක් වන අතර, ඉතිරි රු. 176,495 ක මුදල අයකර ගැනීමට අදාල සිහිකැඳවීමේ ලිපි සහ වාරික වශයෙන් අයකර ගැනීමට අදාල ලිපි යොමුකර ඇත. |
| (ඇ) පෞද්ගලික අයෙකුට හිමි වැලිපිටිය නැවුරල් පාක් නැමැති ඉඩම වෙන්දේසි කිරීමේදී වෙන්දේසිකරු විසින් විදුලිය හා ජලය සපයා ඉඩම වෙන්දේසි කළයුතු වුවද, එම වෙන්දේසි ඉඩමට විදුලිය ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජුනි 21 දින ධීවර අමාත්‍යාංශය විසින් රු.1,674,654 ක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශ විසින් ගෙවූ මුදල් අදාල පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. | ප්‍රදේශයේ විදුලිය නොමැති පවුල් කිහිපයක්ම හඳුනාගෙන අමාත්‍යාංශය මඟින් යෝජනාව ක්‍රියාත්මක කිරීමට ප්‍රථම සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම ප්‍රතිලාභීන් හඳුනාගත හැකිවී ඇත . ඒ වන විට මෙම ඉඩම මිලදී ගත් පුද්ගලයින් මෙහි පදිංචිව සිටි බවත්, එම පුද්ගලයින් විසින් විෂයභාර ගරු අමාත්‍යතුමා වෙත කළ ඉල්ලීමක් මඟින් ඔවුන් ප්‍රතිලාභීන් ලෙස හඳුනාගෙන ව්‍යාපෘතිය දියත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.7,693,534 ක් වැය කර තිබුණි. අදාළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවීම, පාසල් සඳහා භාණ්ඩ මිලදී ගැනීමේදී විෂයභාර ගුරුවරයෙකුගේ අධීක්ෂණයකින් පසු අවශ්‍යතාවයන් හඳුනා නොගැනීම, මිලදී ගන්නා ලද භාණ්ඩ ලේඛනගත නොකිරීම, බෙදාහැරීමේ ලේඛන/සහභාගීත්ව නාම ලේඛන ලිපිගොනු වලට ඇතුළත් නොකිරීම යන නීත්‍යානුකූලව අවශ්‍යතාවයන්ගෙන් බැහැරව අවිධිමත් ලෙස කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු අතර, භාණ්ඩ ලේඛනගත කිරීම, අවශ්‍යතා හඳුනාගැනීම හා අධීක්ෂණ කටයුතු සිදුකළ යුතුය. | මානව සම්පත් පවතින හා ප්‍රතිපාදන නිදහස් කරනු ලබන ආයතන වෙත මෙම වැඩසටහන් විමධ්‍යගත කිරීම හරහා මෙම තත්ත්වය අවම වන බැවින් ඉදිරියේදී ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරමි. |

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර සහායකවරියක වශයෙන් සේවයේ යෙදුණු නිලධාරිනියක් එම සේවයෙන් ඉවත්වී හෝ තාවකාලික මුදාහැරීමක් නොමැතිව හිටපු ආණ්ඩුකාරතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ 2012 අප්‍රේල් 24 දින සිට 2015 ජනවාරි මාසය දක්වා සේවය කළ බවට සාවද්‍ය තොරතුරු දක්වමින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.760,368 ක් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් ලබාගෙන තිබුණු අතර, ඉහත කාලපර්ච්ඡේදය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන්ද වැටුප් හා දීමනා ලෙස රු.733,267 ක් ලබාගෙන තිබුණි. | අවිධිමත්ව ගෙවා ඇති මුදල් වහාම අයකරගත යුතු අතර, වැටුප් ගෙවීමේදී පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු නොකළ නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | නිරීක්ෂණය පිළිගනිමි. මෙම නිලධාරිනියගෙන් මේ වන විට රු.50,000ක් අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල්ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කැබ් රථයක් , ඉකුත් වර්ෂයේ මැයි 3 දින පුද්ගලික වෑන් රථයක ගැටී අනතුරකට ලක්වී තිබුණු අතර එහිදී වෑන් රථයට සිදුවූ හානිය වෙනුවෙන් රු.100,000 ක් කැබ් රථයේ රියදුරුගේ පුද්ගලික මුදලින් ගෙවා තිබුණි. එසේ වුවද , කැබ් රථය අපරැක්ක රෝහල තුළ පිහිටි කොස් ගසක හැපී මෙම අනතුර සිදු වූ බවට සාවද්‍ය තොරතුරු දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.108,975 ක රක්ෂණ වන්දි ලබාගෙන තිබුණි.එසේම ඉහත අනතුර පිළිබඳව පළාත් සභා මූල්‍ය රීති 54 අනුව කටයුතු කර නොතිබුණි. | මූල්‍ය රීති 54 අනුව කටයුතු කළයුතුය. | මූලික විමර්ශනය සිදු කොට අදාල රියදුරු වැරදිකරු ලෙස චෝදනා පත්‍රය සකස්කර විනය නියෝග නිකුත් කර ඇත. එසේම රක්ෂණ සංස්ථාවෙන් ලබා ගන්නා ලද මුදල රියදුරු විසින් නැවත ගෙවීමට කැමැත්ත ප්‍රකාශ කළ අතර, එම රු. 108,975 ක මුදල වාරික 06 කින් අය කර ගැනීමට කටයුතු කර ඇත. |

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2008 සිට 2016 දක්වා වර්ෂවල සමස්ථ ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරඟ හා දකුණු පළාත් සංගීත හා නාට්‍ය තරඟ වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා සහතික පත්‍ර 4691 ක් වැඩිපුර මුද්‍රණය කර තිබුණු අතර, ඒවායේ වටිනාකම රු.122,742 ක් විය. | නිසි සැලසුම් කිරීමෙන් අනතුරුව අවශ්‍ය ප්‍රමාණයට සහතික පත් මුද්‍රණය කළ යුතුය. | නිශ්චිත වශයෙන් සැලසුම්කළ නොහැකිවීම හේතුවෙන් මෙසේ වැඩිපුර සහතික පත්‍ර මුද්‍රණය කිරීමට සිදුවී ඇත. |
| (ආ) | ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් හ/ඉහල බෙලිගල්ල මහා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සඳහා විදුලි අලෝකය ලබා දීමට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 08 දින රු.1,388,159 ක් බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී තිබුණි. පාසල් ළමුන් බෝනොවන රෝග වලට ගොදුරු වීම වැලැක්වීමට රාත්‍රී කාලයේදී ක්‍රීඩා සඳහා | රජයේ අරමුදල් මගින් සිදුකරන ව්‍යාපෘති වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු කළයුතුය | මෙම ව්‍යාපෘතිය දියත් කිරීමේදී ක්‍රීඩා පිටියේ භෞතික ප්‍රගතිය හා භෞතික සංවර්ධනයට අදාළ කාර්යයන් මෙම අමාත්‍යාංශය මඟින් ඉටු නොකරන ලද අතර, විදුලි බල පද්ධතිය ස්ථාපනයට අවශ්‍ය කටයුතු විදුලි බල විෂය යටතේ ක්‍රියාත්මක කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | යොදවා ගැනීමේ අරමුණින් අදාළ විදුහලට මෙම ප්‍රතිපාදන ලබා දී තිබුණද ක්‍රීඩාපිටිය අදාළ කාර්යය සඳහා යොදවා ගෙන නොතිබුණි. | | |
| (ඇ) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තලුන්න ආදර්ශ කිරි ගොවිපලක් පිහිටුවීම සඳහා 2015 වර්ෂයේ සිට අඛණ්ඩව රු.9,568,924 ක් වැයකර තිබුණු අතර ගොවිපල වඩා ඵලදායී කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතුකර නොතිබුණි. කෙසේ වුවද, ගොවිපලේ දැනට සිටින ගවයින් 05 දෙනා නඩත්තු කිරීමද දුෂ්කර නිසා, වෙනත් ගොවිපලකට රැගෙන යාමට නිර්දේශ කර තිබියදී 2018 දෙසැම්බර් 31 දින තවත් රු.500,000 ක් වටිනා කිරි දෙනුන් 05 දෙනෙකු ගොවිපලට මිලදී ගෙන තිබුණි | වියදම් දැරීමට පෙර ඒ සඳහා ලැබිය හැකි ප්‍රතිලාභය පරීක්ෂා කළයුතුය. එසේ නොවන කාර්යයන් සඳහා වියදම් නොදැරීමට වගබලා ගතයුතුය. | සුදුසු වැඩපිළිවෙලකින් තොරව පුද්ගලික ව්‍යවසායකයකු වෙත භාර දීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකි නොවනු ඇත. |

4.7 හඳුනාගන්නා ලද පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් පාසල් 659 ක් සඳහා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමේ කාර්ය සඳහා රු.2,998,372 ක වියදම් දැරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු නොකිරීම ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන්ගේ විචක්ෂණභාවය සහ රාජ්‍ය සම්පත් අරපිරිමැසුම් ලෙස භාවිතා කිරීම පිළිබඳ අවධානය යොමු නොකිරීම නිසා රු.1,057,572 ක පාඩුවක් සිදුව තිබුණි. | විචක්ෂණභාවයෙන් තොරව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | චෙක්පත සැපයුම්කරුට භාරදී නොමැති අතර එම මුදල් පොදු තැන්පතු ගිණුමට මාරු කර රාජ්‍ය ආදායමට බැර කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු 24 දින අනතුරට ලක්වී තිබුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් කැබ් රථයක් අළුත්වැඩියා කිරිමේ වියදම, වාහනය පටවා ගෙන යාමේ ගාස්තු සහ සියයට 25 දෙපාර්තමේන්තු ගාස්තු ඇතුළුව රු.1,629,359 ක මුළු පාඩුව ඊට වගකිව යුතු පාර්ශවයන් ගෙන් අයකර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් 2019 මාර්තු 22 දින දන්වා තිබුණද, එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාඩුව ඊට වගකිවයුතු නිලධාරීගෙන් අයකර ගත යුතුය. | 2019 වර්ෂයේ මැයි මස සිට වාරික වශයෙන් වැටුපෙන් අයකර ගැනීමට තීරණය කර ඇත. |
| (ඇ) | දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා කාර්යාලවලට අයත් නොවිසඳී පවතින අවස්ථා 100 කට අදාළ රු.16,985,578 ක වාහන අනතුරු සම්බන්ධ හානි, අවස්ථා 06 කට අදාළ රු.1,381,468 ක දේපල හානි හා රු.1,837,095 ක මුදල් වංචාවක් ඇතුළු මුළු හානිවල එකතු වටිනාකම රු.20,204,141 ක් විය. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් දිළිඳු බව අවම කිරීම හා විශේෂ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ පළාත් පාලන ආයතන සඳහා ජල බවුසර් 04 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ නොසලකා ප්‍රසම්පාදන කමිටුව විසින් අදාළ මිලදී ගැනීම් සිදුකිරීම හේතුවෙන් රු.9,632,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය පරිදි කටයුතු කළයුතුය. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ 2 න් එක් නිර්දේශයක් ඉන්දියානු තාක්ෂණයෙන් යුක්ත බැවින්ද අනෙක් නිර්දේශය ප්‍රතිපාදන සීමාව ඉක්මවන බැවින්ද ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ නොකරන ලද ආයතනයකින් බවුසර් 04 ක් මිලදීගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. |

## 4.8. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස්බල හා රැකීරක්ෂා අමාත්‍යාංශය මඟින් පාලනය වන සඳලිය සංස්කෘතික මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී සකස් කළ දිස්ත්‍රික් ඉංජිනේරුගේ දින රහිත නිර්දේශය සහිත රු.2,598,802 ක් වූ ඇස්තමේන්තුව ප්‍රකාරව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට 2018 නොවැම්බර් 19 දින පවරා තිබුණි. මෙම ඇස්තමේන්තුව සැකසීම සඳහා ප්‍රමාණ ගැණුම් පත්‍ර (Quantity Taking Off Sheet) සකස් කර නොතිබුණු බැවින් මෙය විධිමත් ඇස්තමේන්තුවක් නොවීය. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ ලංසු බැඳුම්කරය (Bid Guarantee) මෙන්ම කාර්යසාධන ඇපකරයද ව්‍යාජ ඒවාවූ අතර,මෙම ඉදිකිරීම් කටයුතුවලදී වූ වැඩ විෂයයන් 5ක් සඳහා රු.240,548 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරු අසාදුලේඛනගත කළයුතු අතර, වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. | ඇස්තමේන්තුව සඳහා ප්‍රමාණ ගැණුම් පත්‍ර සකස් කර ඇත. ව්‍යාජ ඇපකර ඉදිරිපත් කර ඇති බව කොන්ත්‍රාත්කරු විසින් පිළිගෙන තිබූ බැවින් කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කිරීම සඳහා නිර්දේශ කර ඇත.කොන්ත්‍රාත්තුවේ මැනුම් පත්‍රයන්හි අඩුපාඩු හේතුවෙන් වැඩිපුර ගෙවා ඇති රු.240,548 ක මුදල කොන්ත්‍රාත්තුවේ රැඳවුම් මුදලින් අඩුකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | ඇල්පිටිය මහජන ක්‍රීඩාංගනය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | වැඩ විෂය අංක B – 2 අනුව අනුමත ගුණත්වයෙන් යුතු පස් සපයා මුට්ට කළයුතු අතර, (Approved Quality soil supplying and pilling) ක්‍රීඩාපිටියට සපයන ලද පස්වල තිබිය හැකි ගල්වල උපරිම විශාලත්වය මි.මී.37.5 ක් විය. නමුත් සපයා අතුරන ලද පස්වල අඩි 1 1/2 ක් වූ ගල්ද තිබුණි. ඒ අනුව නිසි ගුණත්වයෙන් තොරව පස් සපයා තිබියදී ඒ පිළිබඳව නොසලකා සැපයුම්කරු වෙත රු.3,354,000 ක් ගෙවා තිබුණි. පසුව සපයන | ඇස්තමේන්තුව පරිදි නියමිත ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය සපයා ගතයුතුය. | පස් පිළිබඳ අවසන් රසායනාගාර වාර්තාවක් ලබාගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ලද පස්තට්ටුවේ ඇති ගල් වෙනුවෙන් පස් ඝණ මීටර් 75 ක් අඩුකර ගෙවීම් කර තිබූ නමුත් එය නිවැරදි ක්‍රියාමාර්ගයක් නොවීය. | | |
| (ii) | යන්ත්‍ර මඟින් පස් තුනී කිරීම සඳහා අඩු මිලගණන් තිබියදී, ශ්‍රමිකයන් යොදවා පස් තුනී කිරීම සඳහා වැඩි මිලගණන් ඇස්තමේන්තුවට ඇතුළත්කර ගෙවීම් කිරීම නිසා පළාත් සභාවට රු.956,535 ක පාඩුවක් සිදුව තිබුණි. | ප්‍රායෝගික මෙන්ම ආර්ථික වනසේ මිලගණන් සකස්කළයුතු අතර පළාත් සභාවට සිදුවූ පාඩුව අයකරගතයුතුය. | පස් තුනීකිරීම සිදුකළ යුත්තේ යන්ත්‍ර මඟින්ද ශ්‍රමිකයන් මඟින්ද යන්න ඇස්තමේන්තුවේ වැඩ විස්තරයෙහි ඇතුළත්කර නොමැති බැවින් එම වැඩය සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කරන මිල ගණන් අනුව වැඩය සම්පූර්ණ කළ පසු ගෙවීම් කිරිම පිළිගත් ක්‍රමවේදය විය. |
| (iii) | ගංගා වැලි වෙනුවට විධිමත් අනුමැතියක් රහිතව මුහුදු වැලි භාවිතාකර තිබුණු අතර ඒ අනුව වැලි මීටර් කියුබ් 200 ක් සඳහා මීටර් කියුබ් 1 කට රු.3,998 බැගින් රු.799,600 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2018 දෙසැම්බර් 3 දිනැතිව රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය විසින් මේ පිළිබඳව ලබාදී තිබුණු පරීක්ෂණ වාර්තාව අනුව මුහුදු වැලි යෙදීමට පෙර කිසිඳු පරීක්ෂණයක් කර නොතිබුණු අතර එම සිනිඳු වැලි යෙදීම හේතුවෙන් දිගුකාලීනව ජල වහන පද්ධතිය අක්‍රීය වන බව වාර්තා කර තිබුණි. | පරීක්ෂණයකින් හා අනුමැතියකින් තොරව සිදුකරන ලද ඉදිකිරීම් සඳහා වැඩිපුර ගෙවනලද මුදල් ආපසු අයකර ගත යුතුය.මෙවැනි අක්‍රමිකතා අවම කිරීම සඳහා විනයානුකූල පියවර ගතයුතුය. | ගංගා වැලි හිඟ බැවින් කොන්ත්‍රාත්කරු විසින් මුහුදු වැලි භාවිතා කර ඇත. |
| (ඇ) | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ රු.35,381,059 ක මූල්‍ය ප්‍රතිපාදන මත මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද බෙරුවල ප්‍රදේශයේ ඇළ මාර්ග 03 ක නවීකරණ කටයුතු පිළිබඳව අධීක්ෂණය මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ඉංජිනේරු හා දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීන් විසින් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී සිදුකරන ලද | මෙම ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය පියවර ගතයුතුය. | මූලික විමර්ශන වාර්තාව ලද පසු එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | විගණන පරීක්ෂාවේදී ඉටුනොකළ වැඩ, නියමිත ප්‍රමිතියට ඉටු නොකළ වැඩ, සාවද්‍ය මිනුම් මත වු වැඩ සහ විධිමත් අනුමැතියක් රහිතව ඉටුකරන ලද බාහිර හා අමතර වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම වැනි අඩුපාඩු රාශියක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන විමසුමට අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ විගණන විමසුමේ පිටපතක් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා වෙත 2018 මාර්තු 27 දින යොමුකර ඇතත්, අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් වූ මූලික විමර්ශණය 2019 මාර්තු 31 දක්වා නිමකර නොතිබුණි. | | |
| (ඇ) | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත 2014 වර්ෂයේදී ආරම්භ කර 2016 වර්ෂයේදී නිම කරන ලද කටුවන ප්‍රාදේශීය සභාවට අයත් කිරම බස් නැවතුම්පොළ අළුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක U – 02 යටතේ වූ මිලිමීටර් 200x75x80 ප්‍රමාණයේ කොන්ක්‍රීට් කුට්ටි ගල් වෙනුවට මිලිමීටර් 222x111x80 ප්‍රමාණයේ කුට්ටි ගල් අතුරා තිබියදී , ඒ පිළිබඳව නොසලකා හා අදාළ කොන්ක්‍රීට් කුට්ටි ගල්වල ශක්තිය පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව රු.2,452,808 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳව විගණන විමසුමක් තිබියදී ඒ පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරුට රඳවුම් මුදල්ද ගෙවා තිබුණි. 2018 ජනවාරි 22 දින සිදු කරන ලද රසායනාගාර පරීක්ෂාවට අනුව මෙම කොන්ක්‍රීට් කුට්ටි ගල් නියමිත ප්‍රමිතියෙන් තොර බව තහවුරු විය. | ඇස්තමේන්තුව පරිදි නිසි ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය යොදාගත යුතුය. | කර්මාන්තය නිම කර වසර 2කටත් පසුව නැවත සාම්පල් ගෙන පරීක්ෂා කිරීම සිදු කල බවත්, මේ වන විටත් බස් අංගනයේ ඇති කුට්ටි ගල් කිසිදු හානියකට පත්වී නොමැත. |

| | | |
|---|---|---|
| (ඉ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2014 වර්ෂයේදී හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් 2015 සහ 2017 වර්ෂවලදී මාතර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන මත රු.35,721,029 ක් වැයකර ඉදිකරන ලද දෙයියන්දර ප්‍රාථමික පාසල සඳහා වූ ගොඩනැඟිලි භාරගැනීම පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2019 අප්‍රේල් 10 දින දක්වා මෙම ඉදිකිරීම් නිෂ්කාර්යව පැවතුණි. | නිසි ප්‍රමිතියට ඉදිකිරීම් ඉටුකර ගැනීමට කටයුතු කළයුතුය. | අදහස් දක්වා නැත. |

4.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

4.9.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දකුණු පළාතේ පාසල්වල නවීකරණ කටයුතු හෝ ඉදිකිරීම් කටයුතු සඳහා, එක් පාසලකට රු. මිලියන 02 බැගින් පාසල් 80 ක් වෙත, රු. මිලියන 160 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින පාසල් සංවර්ධන සමිති වෙත මුදා හැර තිබුණි. නවීකරණ හා ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු මාසය වනවිට අවසන් කළයුතු බව දන්වා තිබුණද, 2019 මැයි 07 දිනට වූ භෞතික ප්‍රගතිය අනුව වැඩ ආරම්භ කර නොමැති පාසල් 14 ක් හා වැඩ නිම කිරීමේ ප්‍රගතිය සියයට 50 ට අඩු පාසල් 28 ක් පැවතීමෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. | වැඩ ආරම්භ කර නැති ව්‍යාපෘති ආරම්භ කර නිම කිරීමට හා භෞතික ප්‍රගතිය අඩු ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය. | මේ සම්බන්ධ ප්‍රගති වාර්තා කැඳවීම නිරන්තරව සිදු කරයි.ප්‍රගතිය ඉදිරිපත් නොකල විදුහල්පතිවරුන් කැඳවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

4.9.2 අතහැර දැමූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ අම්බලන්ගොඩ තිලකපුර ජල යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් ඉකුත් වර්ෂයේ ජුනි 07 දින රු.2,743,937 කට ගිවිසුම් ගත වී තිබූ අතර කර්මාන්තය නිමකළ යුතු දිනය 2018 ජුනි 30 විය. එහෙත් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පමණක් දින දීර්ඝ කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ මාර්තු 13 දින රු.411,552 ක් ගෙවා තිබුණි. මෙහිදී ප්‍රමාද දඩ අයකර නොතිබූ අතර අදාළ ව්‍යාපෘතිය නතර කර තිබුණි. | කර්මාන්ත අතරමඟ නතර කිරීම සම්බන්ධව සොයා බලා ඒ පිළිබඳව කටයුතු කිරීම හා ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු කඩිනමින් කරවා ගැනීමට. කටයුතු කළයුතුය. | එම කාලසීමාවට අදාලව ප්‍රමාද දඩ, රැඳවුම් මුදලින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | පළාත් ධීවර අමාත්‍යාංශය විසින් රු.1,732,993ක් වැයකර ඉදි කර තිබුණු රුවිනිගම බහුකාර්ය පුහුණු මධ්‍යස්ථානය 2016 ජුලි 07 දින කාර්මික සංවර්ධන අධිකාරියට ලබා දී තිබූ අතර, නවීකරණය සඳහා අධිකාරියද රු.1,499,857ක් වැය කර තිබුණි.එසේ වුවද, පුහුණු මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කිසිදු කාර්යයකට යොදවාගෙන නොතිබුණි. | බහුකාර්ය පුහුණු මධ්‍යස්ථානය අදාළ කටයුත්තට යෙදවීමට කටයුතු කළයුතුය. | 2019 වර්ෂයේ මෙම මධ්‍යස්ථානය ඵලදායී ආයතනයක් බවට පත් කිරීම උදෙසා බෑග් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට නියමිතව ඇත. |
| (ඇ) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්මේ ඇතුළත් රු.3,059,485 ක් වූ ව්‍යාපෘති 03 ක් ඉටු කිරීම සඳහා ලියාපදිංචි සමිති සමඟ ගිවිසුම්ගත වී තිබුණි. සමිති විසින් අදාළ කාලය තුළදී කාර්යයන් ඉටු කර නොතිබුණි. සමිති සිය කාර්යයන් පැහැර හැරීම සම්බන්ධයෙන් සමිති නිර්දේශ කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලධාරීන් දැනුවත් කිරීමට සහ එම සමිතිවලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළයුතුය. | මෙම ව්‍යාපෘතීන් ඉටු කිරීම සඳහා තෝරාගත් ලියාපදිංචි සමිති විසින් අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ අංශයන් දැනුවත් කර ඇත. |

4.9.3 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්මික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ බෝගහපැලැස්ස පේෂකර්ම මධ්‍යස්ථානය නවිකරණය කර අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඇති කිරිමට 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.13,184,083 ක් වැයකර තිබුණි. පසුව අධිකාරියේ පරමාර්ථ හා කාර්යයන් යටතට නොගැනෙන සංචාරක නිවාඩු නිකේතනයක් සඳහා මෙම ඉදිකිරීම් භාවිතා කර තිබුණි. | අධිකාරිය පිහිටුවීමේ අරමුණුවලට අනුව කටයුතු කළයුතුය. | 2014 වර්ෂයේදී බෝගහපැලැස්ස මධ්‍යස්ථානය, සංචාරක නිකේතන මධ්‍යස්ථානයක් ලෙස නවීකරණය කිරීම සඳහා අනුමැතිය හිමිව ඇත. |
| (ආ) | තුලිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ලබා දී තිබූ රු.8,800,000 කින් රු.4,302,225 ක් ව්‍යාපෘතියේ අරමුණුවලින් බැහැර කාර්යයක් සඳහා වැය කර තිබූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ අරමුණු අනුව කටයුතු කළයුතුය. | මෙම ප්‍රතිපාදන අතුරින් පළාත් පාලන ආයතනවල මාර්ග සංවර්ධන කටයුතු සඳහා ලබා දී තිබුණු මුදල එම කාර්යය වෙනුවෙන් ද ඉතිරිය අනිකුත් අනුමත වැඩ යෝජනා වෙනුවෙන් ද උපයෝජනය කර ඇත. |

4.10 වත්කම් කළමනාකරණය

නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හබරාදූව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය වෙත 2016 ජුලි 29 දින ලැබී තිබුණු රු.72,675 ක්වූ ශබ්ද විකාශන පද්ධතිය භාවිතයෙන් තොරව ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම | අදහස් දක්වා නොමැත |

| | | | |
|---|---|---|---|
| (ආ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියට අයත් අක්කර 55 ක් වූ හුංගම සමෝධාන ගොවිපල භූමිය තුළ අක්කර 11 ක භූමි ප්‍රමාණයක් තවදුරටත් කිසිදු කාර්යයකට යොදවා නොතිබුණි. ගවයින් 20 ක් ගාල් කර තැබිය හැකි ලෙස ඉදිකර තිබූ ගව ගාලක්ද නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම | ඉදිරියේදී භාවිතා කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියට අයත් වාලිමවුන්ට් කර්මාන්තපුරයේ කාර්යාලය පිහිටි ගොඩනැලිලේ ප්‍රධාන ශාලාව හා එයට යාබඳ වූ කාමර 03 වර්ෂයකට පෙර රු.2,899,471 ක් වැයකර නවීකරණය කර තිබුණද, ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනිමට කටයුතු කිරීම | මෙම වාලිමවුන්ට් කර්මාන්තපුරය කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ල කාර්යාලීය කටයුතු හා කර්මාන්තපුර රැස්වීම් සඳහා භාවිත කරන අතර, කර්මාන්තපුර පැවති ජල ප්‍රශ්නය විසඳීමත් සහ පරිහරණයට ගත හැකි තත්ත්වයට පත් කිරීමත් සමඟ ඉහත ගොඩනැඟිල්ල ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සඳහා භාවිත කිරීමට සැලසුම් කර ඇත. |

4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභා නිලධාරින්ගෙන් 4392 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සහ අතිරික්ත නිලධාරින් 59 දෙනෙකුගේ තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සහ අතිරික්තතා විධිමත් කිරීමට කටයුතු කළයුතුය. | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩල වාර්තාව 2013.01.01 දින සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව, 2019 වර්ෂය වන විට ආසන්න වසර 06ක් දක්වා කාලය තුළදී පළාත තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ සේවා ප්‍රවණතාවයක් මත බඳවා ගැනීම් සිදු කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් සභාව තුළ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් හා සේවකයන් 892 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුව බඳවාගැනීම් කළයුතුය. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් සිදු කිරීමට අදාළ කටයුතු මේ වන තෙක් අවසන් වී නොමැති බැවින්, එකී පදනමින් සිටින නිලධාරීන් ද මේ යටතේ ඇත. |

4.12 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධීවර අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව පලතුරු පැල 21,355 ක් රු.1,554,490 කට මිලදී ගෙන තිබුණු අතර, ඇණවුම් කළ පැල වෙනුවට සැපයූ පැල සඳහා රු.695,120 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ පැල මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන තීරණයන්ට අනුකූල නොවන ලෙස රු.861,730 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතුය. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව අමතර පලතුරු පැල වර්ග මිලදී ගැනීමට කටයුතු කර ඇත. |

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වියදම් ශීර්ෂ 25 හි ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු.3,494,775,957 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන උපයෝජනය කළයුතුය. | සියයට 5ට වඩා ඉතිරිවීම් ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කළ අතර ඉදිරියේදී ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමේදී අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් වී ප්‍රතිපාදන ඉල්ලීම් කරන ලෙසද |

ඉතිරිවීම් අවම වන පරිදි කටයුතු කරන ලෙසද දැනුවත් කර ඇත.

5.2 තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව දකුණු පළාත් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළගාවීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍යවන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීමට කටයුතු කළයුතුය. | තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට අදාල කාර්යයන් සංවර්ධන සැලැස්මට ඇතුලත් කර ඇත. අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් ඇතිකරගනිමින් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වමින් පවතින තත්වය වැඩිදියුණු කරගැනීමට අපේක්ෂා කරමි. |
| (ආ) | තිරසර සංවර්ධන ඉලක්කකරා ළගාවීම සඳහා සුදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේදී හා පෙර සුදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හෝ දුර්වල තත්ත්වයක පැවැතුණි. | | |